**හිමාලි ද කොස්තා**
සහකාර අධ්‍යක්ෂ,
භූමි සම්පත් අංශය, පරිසර අමාත්‍යාංශය

# ජෛව විවිධත්වය හා බැඳුනු කොළඹ හා ඒ ආශ්‍රිත උප නගර නාමයන්

ශ්‍රී ලංකාව කුඩා දූපතක් වුවත් ජෛව විවිධත්වය අතින් ඉතා ඉහළ අගයක් ඇති රටකි. මෙරට පවතින භූ විෂමතාවය හා දේශගුණ තත්වයන් මෙලෙස ඉහළ ජෛව විවිධත්වයක් ඇති වීමට බලපා ඇත. ලෝකයේ ජෛව විවිධත්වය උණුසුම් ස්ථාන 36 අතරට ශ්‍රී ලංකාවේ තෙත් කලාපය ඇතුළත්වීම මෙරට ජෛව විවිධත්වයෙහි වැදගත්කම විදහා දක්වයි.

මෙරට පවතින සංස්කෘතික විවිධත්වය, පාරම්පරික දැණුම යන කරුණු සියල්ල කෙරෙහි ජෛව විවිධත්වයේ බලපෑම සුළුපටු නොවේ. අපගේ පැරැණ්නන් යම් යම් ස්ථාන හා පුද්ගල නාම යෙදීමේදී පවා ජෛව විවිධත්වයේ ඇසුර ලබා ගෙන ඇති බව විමසිලිමත්ව බැලීමේදී පැහැදිලිවේ. මෙරට ග්‍රාම නාම බොහෝමයක් සතුන්ගේ නම්, ශාකවල නම් හා පරිසර පද්ධති ඇසුරෙන් නිර්මාණය වී ඇති බව පෙනීයයි. ඇතා වැටුනු වැව, කොටියා කුඹුර, නා උල, අඟුණකොළ පැලැස්ස, ගොනාමළ කන්ද, වලහාවැටුණුගල වැනි ග්‍රාම නාම මේ සඳහා ගෙනහැර දැක්විය හැකි උදාහරණ කීපයකි. මේ හැරුණු විට පුද්ගල නාම සැකසීමේදී ද අතීතයේ මෙන්ම වර්ථමානයේදීද විවිධ ශාක හා පුෂ්පවල නම් යොදා ගෙන ඇති වග සපුමලී, නාමලී, බිරනමලී , සේපාලිකා, සමන්මලී, නාමල්, සපුමල් වැනි පුද්ගල නාමවලින් පැහැදිලි වේ.

කලින් සඳහන් කළ පරිදිම මෙරට ග්‍රාම නාම සඳහා ජෛව විවිධත්වයේ බලපෑම සොයා බැලීමේදී එම ප්‍රදේශ ආශ්‍රිතව අතීතයේ පැවති ජෛව විවිධත්වය නිසා එම නම් ලැබී ඇති බව පැහැදිලි වේ. එම නිසා මෙම ග්‍රාම නාම අධ්‍යනය තුළින් අතීතයේ එම ප්‍රදේශ ආශ්‍රිතව පැවති ජෛව විවිධත්වය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ඇත. උදාහරණයක් ලෙස අතීතයේ මෙරට වාසය කළ බව පැවසෙන දැනට වඳවී ගොස් ඇති "ගවරා" නම් සත්වයා ආශ්‍රිතව නම් තැබූ, එනම් ගවරවෙල, ගවරකන්ද හා ගවර හෙල ආදී ග්‍රාම නාම රාශියක් මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව පවතී. මෙම ප්‍රදේශ සඳහා මේ නම් ලැබීමට මෙම සත්ව විශේෂය එම ප්‍රදේශවල වාසය කිරීම හේතුවී ඇතැයි සැලකේ. ගවරා මහනුවර යුගයේ අග දක්වා ම ලංකාවේ කැළෑවල විසූ ඉතා ශක්තිමත් සතකු විය. ගවරා හැඩි දැඩි ලෙස වැඩුණු දැවැන්ත කුළු හරකෙකුට වඩා උස මහත වූ, කැළෑව තම රාජධානිය කොට ජීවත් වූ සත්වයෙකි. රොබට් නොක්ස්ගේ 'ලංකා විස්තරය' අනුව දෙවැනි රාජසිංහ රජු (1636 - 1687) තම සුරතලයට සුදු ගවරකු ඇතිකර ඇති බව සඳහන් වේ. උඩරට කඳුකරයේ සීතල ඝන කැළෑ එදා ගවරුන්ගේ නිජබිම් විය. බ්‍රිතාන්‍ය ජාතිකයන් මුලදී කෝපි වතු සඳහා ද ඉන් පසු තේවතු සඳහා ද මේ ඝන වනාන්තර විනාශ කිරීම එම පරිසරයට මෙන් ම වනසතුන්ට ද තදින් බලපෑවේය. මධ්‍ය කඳුකරයේ කැළෑ තුළ අන්තිමට ජීවත් වූ කැළෑ ගවරුන් මේ වන විට සම්පූර්ණයෙන්ම වඳවී ගොස් ඇත. ගවරා ගේ යැයි සැක කළහැකි අස්ථි කොටස් 1962 දී රත්නපුර ප්‍රදේශයේදී ආචාර්ය පී.ඊ.පී. දැරණියගලයන්ට හමුවී ඇත. මීට අමතරව මෙවන්

ගවේෂණ කිහිපයකින් ගවරා ගේ යැයි සැක කළ හැකි ෆොසිල හමුවී ඇත. එම සත්වයා මෙරට ජීවත්වූ බවට අද වන විට ඉතිරිව ඇති එක් සාක්ෂියක් ලෙස මෙම ග්‍රාම නාම ද දැකිවිය හැකිය.

අද වන විට ඉතා ජනාකීරණ මෙන්ම අපගේ වානිජ අගනගරය ලෙස සැලකෙන කොළඹ නගරයද අතීතයේ ජෛව විවිධත්වයෙන් සපිරි සුන්දර පෙදෙසක් වූ බව අතීත වාර්ථාවන්ට අනුව පෙනී යයි. කොළඹ නගරයේ හා ඒ ආශ්‍රිත උප නාගරික ප්‍රදේශවල ග්‍රාම නාම හා වීදි නාම දෙස විමසිලිමත්ව බැලීමේදී එම ප්‍රදේශ ආශ්‍රිතව අතීතයේ පැවති තුරුලතා හා සත්ව සන්තතිය නිසා එම ප්‍රදේශවලට එම නම් ලැබුණු බව පෙනීයයි. අද වන විට අහස උසට නැඟි ගොඩනැගිලි හා රථවාහනවල ඝෝෂාවෙන් පිරුණු කොළඹ නගරය හා ඒ ආශ්‍රිත උප නගර වල අතීත ජෛව විවිධත්වය කෙබඳු වීදැයි පිළිබඳ යම් අදහසක් ලබා ගැනීමට මෙම නම් හා ඒ හා බැඳුණු අතීත තොරතුරු අධ්‍යනය කිරීම ආස්වාදය දනවන කටයුත්තකි.

කොළඹ නගරයට එම නම ලැබීම සම්බන්ධයෙන් ප්‍රධාන මත කීපයක් පවති. ඉන් එක මතකයකට අනුව කොළඹ වරාය ආසන්නයේ පිහිටි ගෙඩි රහිත කොළවලින් පිරි විශාල අඹ ගසක් නිසා ඒ නම ලැබුණු බව ලක්දිව පෘතුගීසි යුගය පිළිබඳ විවරණයක් කරන පර්නාවෝ ක්වේරෝස් පියතුමාගේ ලේඛනවල සඳහාන් වේ. ඒ අනුව කොළ-අඹ, කොළඹ වූ බව පැවසේ. තවත් මතයකට අනුව මෙම පෙදෙස ආශ්‍රිතව පැවති විශාල කොළොන් වෘක්ෂයක් හේතුවෙන් ඒ නම ලැබුණු බව සඳහන්වේ. මේ හැරුණු විට පුරාතන යුගයේදී කොළොන්නාව දෙසින් පැමිණි කොළොන්නා ඔය නම් ගංගාවක් කොළඹ වරාය මැදින් මුහුදට වැටුණු ස්ථානය කොළොන්තොට වූ තවත් මතයකි.

කුරුඳුවත්ත ප්‍රදේශයට ඒ නම ලැබී ඇත්තේ ඒ ප්‍රදේශය පුරා පැතිර තිබූ කුරුඳු කැලෑව නිසාය. අද කොළඹ හත හෙවත් කුරුඳුවත්ත වශයෙන් හැඳින්වෙන ප්‍රදේශය අතීතයේ කුරුඳුවත්ත වශයෙන් හැඳින්වෙන ඉසව්වේ සිට යුනියන් පෙදෙස හරහා අද පුංචි බොරැල්ල හා මරදාන වශයෙන් හැඳින්වෙන ස්ථාන තෙක් පැතිරී පැවතිනි. වර්ෂ 1789 වන විට මෙහි අක්කර 289 ක පමණ ප්‍රමාණයක කුරුඳු වගා කර තිබූ බව පැවසෙයි.

අද දිනය වන විට "බ්ලුමැන්ඩල්" යන නම ඇසීමේදී අපට නිතැතින්ම සිහියට නැගෙන්නේ ''බ්ලුමැන්ඩල්'' කුණු කන්දයි. නමුත් මෙම ප්‍රදේශය ලන්දේසින් පාලන සමයේදී වන ගහනයෙන් සමන්විත සුන්දර පෙදෙසක් විය. එමෙන්ම මෙම ප්‍රදේශය ආශ්‍රිතව මල්වලින් පිරුණු අලංකාර පොකුණක් ද තිබුනු බව පැරණි වාර්ථාවල සඳහන්වේ. "බ්ලුමැන්ඩල්" යන ලන්දේසි නාමයේ අරුත වන්නේ ගස්වලින් සමන්විත වූ යන්නයි. එකල එම ප්‍රදේශයේ Bloemen නමින් මල් වර්ගයක්ද විශාල වශයෙන් ව්‍යාප්තව පැවති බව පැවසෙන අතර ඒ අනුව අද දක්වාම එම පෙදෙසට "බ්ලුමැන්ඩල්" යන නම භාවිතා වේ. කාලයත් සමග අලංකාර වන මලින් හා නිල් දියෙන් යුත් පොකුණකින් යුතු වූ ප්‍රදේශය කුණු කන්දක් බවට පරිවර්තනය වීම ඛේදජනක කරුණක් නොවන්නේද?

කොළඹට ආසන්න බම්බලපිටිය ප්‍රදේශයට ඒ නම ලැබුනේ එම ප්‍රදේශයේ "බම්බ" නමින් ප්‍රචලිතව පැවති කැලෑ ගස් වලින් පිරුණු පෙදෙසක් නිසා යැයි සදහන් වේ. බම්බ+වල+පිටිය පසුව බම්බලපිටිය වූ බවට මතයක් පවතී.

කොල්ලුපිටියට ඒ නම ලැබුනේ අඹන්වල රාළ නම් පුද්ගයෙකු කොල්ලකාගත් පොල් වත්තක් නිසා යැයි මධ්‍යම ලංකා පුරා වෘත්තයේ සඳහන් වේ.

අතීතයේ බේරේ වැවේ සිටි ඉබ්බන් බහුල වශයෙන් අව්ව තැපීමට රැඳි ස්ථානය ඉබ්බන්වල නම් වූ බව පැවසේ.

කොස්ගස් හන්දියට හා දිවුල් ගස් හන්දියට ඒ නම් ලැබීමට හේතුව කොස් ගස් හා දිවුල් ගස් බව කියැවේ. නමුත් අද දින වින විට එම ප්‍රදේශවල කොස් ගස් හෝ දිවුල් ගස් බෙහෙතකට වත් සොයා ගැනිමට නොහැක. එමෙන්ම දෙමටගොඩට හා තිඹිරිගස්යාය යන නම් ද නමින් හැදෙන සේම දෙමට හා තිඹිරි ගස් මුල්කොටගෙන බිහිවු බව පැවසේ.

කොටහේන ප්‍රදේශයේ සැබෑවටම කොට ගස්වලින් සමන්විත වූ හේනක් අතීතයේ පැවති බව පැවසේ. එක් කලෙක මේ ප්‍රදේශයේ තිබූ වන රොදේ විශාල ගින්නක් පැතිර ගිය බවද දා පිලිස්සී ගිය ගස්වල කොට කැබලි පමණක් ශේෂ වූ බවද ඒ අනුව මේ නම ඇතිවු බවද සැලකේ.



කොළඹ කුරුඳුවත්ත ප්‍රදේශ 1800 අග භාගයේ...




1908 කොළඹ කුරුඳුවත්ත ප්‍රදේශයේ මාර්ගයක්



වර්ථමාන කුරුඳුවත්ත ප්‍රදේශයේ මාර්ගයක්

මෝදර ආදුරුප්පු වීදිය ප්‍රදේශය ලන්දේසි යුගයේදී හැඳින්වූයේ වුල්ෆන්ඩෝල් නමිනි. මෙහි තේරුම වෘකයින්ගේ තැන්න යන්නයි. එකල මේ ප්‍රදේශයේ මඩ වගුරු හා කැලෑ විශාල වශයෙන් පැවති අතර ඒ අවට නිතර සිවලුන් ගැවසී ඇත. ලන්දේසීන් මේ සිවලුන් කිසියම් හේතුවක් නිසා වෘකයින් සේ සැලකීමෙන් මේ ප්‍රදේශයට වෘකයින්ගේ තැන්න හෙවත් වුල්ෆන්ඩෝල් යන නම තබා ඇත. එකල මේ පෙදෙස් නරින්ගේ "හූ" හඬ නිරන්තරයෙන්ම රැව් දුන් බැව් පැවසේ. ආදුරුප්පු වීදිය යාබදව පැතිරුණු මාදං කැලයෙන් මාදම්පිටිය උපත ලැබීය.

අද දින ඩී. එස් සේනානායක විද්‍යාලය පිහිටි ප්‍රදේශයට අතීතයේ ව්‍යවහාර වූයේ "කුඹී කැලය" යන්නයි. ඝන කැළෑ රොදක් ප්‍රදේශය වසා පැතිරී තිබූ බවත් ඇතැම් විට අබිරහස් ලෙස මරා දැමුවන් එහි රූස්ස ගස්වල අතුපතර එල්ලා තිබූ බව ඉපැරණි කොළොම්පුරය ගැන ඇති සමහර කතා වල සඳහන් වේ.



කයිමන් දොරටුව ආශ්‍රිත ඝණ්ඨා කුළුණ හා ඒ අවට 1860 දී

ලන්දේසි යුගයේදී පිටකොටුවේ සිට කොටුවට ඇතුලු වීමට නැගෙනහිර දෙසින් පැවති දොරටුව "කයිමෙන් දොරකඩ" නමින් හැඳින්විනි. පිටකොටුව කෙලින් වීදිය ආසන්නයේ එකල ගලා ගිය බේරේ වැව හා බැඳුන ඇළ මාර්ගයේ බේරේ වැවෙන් පැමිණි කිඹුලන් විශාල වශයෙන් මේ ප්‍රදේශයේ ගැවසී ඇත. කයිමන් (Kaiman) යනු ලන්දේසි බසින් කිඹුලා යන්නයි. ඒ අනුව එම දොරටුව Kaiman poort යන ලන්දේසි බසින් හඳුන්වන ලද අතර එය "Kaiman gate" ලෙස ඉංග්‍රිසියටද "කයිමන් දොරටුව" ලෙස සිංහලටද පෙරළිනි.



කයිමන් දොරටුව ආශ්‍රිත ඝණ්ඨා කුළුණ හා ඒ අවට වර්ථමානයේ දක්නට ලැබෙන අයුරු

කොළඹට ආසන්න ඉතා ප්‍රසිද්ධ උප නගර කීපයක නාමයන් ද ජෛව විවිධත්වය හා බැඳි පවතී. වර්ථමාන නුගේගොඩ නගරය අතීතයේ වගුරු බිමක් ලෙස පැවති බව පුරාවෘත්තවල සඳහන් වේ. ඒ අසලින් දොළ පාරක් ගලාගොස් ඇති අතර ඒ ආශ්‍රිතව විශාල නුග ගසක් ද තිබී ඇත. මේ අසලින් ගමන් කළ මිනිසුන් මේ දොළ පාර තරණය කිරීම සඳහා නුග ගසේ පහළට එල්ලී තිබූ නුග මුල්වල එල්ලි එම දොළ පාර තරණය කළ බවද එසේ නුගෙන් එල්ලී එගොඩවූ ස්ථානය පසුකාලීනව නුගෙන් එගොඩ, නුගේගොඩ වූ බව සඳහන් වේ.

නුගේගොඩ නගරයට ඉතා ආසන්න ප්‍රදේශයක්වූ දෙල්කඳ හන්දිය වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ "දෙල්කඳ පොළ" නිසාය. දෙල්කඳට එම නම ලැබුනේ ඒ ස්ථානයේ වූ ඇළ තරණය කිරීම සඳහා දෙල් ගසක් ඒ හරහා දමා තිබූ නිසා බව කියැවේ.

රත්මලාන ප්‍රදේශයට ඒ නම ලැබී ඇත්තේ ඒ ප්‍රදේශයේ රත් මල් විශාල වශයෙන් වැවී තිබූ නිසා බවත්, රත්මල්යාය පසුකාලීන ව්‍යහාරයේ දි රත්මලාන වූ බවත් පැවසේ.

වර්ථමානයේ රෙදි පිළි වෙළදාම නිසා ප්‍රසිද්ධියට පත්වී ඇති මහරගම හන්දියේ 1900 යේ මුල් දශකවල හික් ගස් රාශියක් පැවති බව අතීත තොරතුරුවල සඳහන් වේ. 1950 දී පමණත් එහි හික් ගස් දක්නට ලැබුණු බවත් ඒ වන විටත් මහරගම හන්දිය වැඩිහිටියන් හැඳින්වූයේ “හික් ගස් හන්දිය” ලෙසින් බවත් සඳහන් තිස්ස අබේසේකරයන්ගේ “Bringing Tony Home” ග්‍රන්ථයේ සඳහන් වේ.

වර්ථමානයේ සීඝ්‍ර දියුණුවක් ලබා ඇති බොරලැස්ගමුව හන්දිය ඒ ආශ්‍රිතව පැවති නා ගස් නිසා 1900 යේ මුල් දශකවලදී හඳුන්වා ඇත්තේ “නාගස් හන්දිය” ලෙසින් බව තිස්ස අබේසේකරයන්ගේ පිටගම්කාරයෝ ග්‍රන්ථයේ සඳහන් වේ. වර්තමානයේ ඒ නම දන්නා වැඩිහිටියෙකු සොයා ගැනීම පවා දුෂ්කරය.




බොරලැස්ගමුව 1910 දී



වර්ථමාන බොරලැස්ගමුව

සිංහල භාෂාවේ “වල” යන්න කැලය, වනාන්තරය යන්නට සමාන පදයක් වේ. එමෙන්ම ‘‘හින්න”, “වින්න” යන වදන්ද එම අරුතම දේ. ඒ අනුව “වල”,”හින්න”, “වින්න” යන්නෙන් අවසන්වන ග්‍රාම නාමවලින් එම ස්ථානවල කැලයක් තිබූ බව පැහැදිළි වේ. උදාහරණ ලෙස නාවල, දෙහිවල, නාවින්න ආදී කොළඹ නගරයට තදාසන්න උප නගර නාමවලින් පැහැදිලි වනසේම නා කැලයක් හා දෙහි කැලයක් එම ප්‍රදේශ ආශ්‍රිතව තිබුනු බව අපට අනුමාන කළ හැකිය.

මීට අමතරව මෙහි සඳහන් නොවූ කොළඹ නගරයට තදාසන්න බොහෝ නගර හා මංමාවත්වල නාමයන් බොහෝමයක් ජෛව විවිධත්වය හා බැඳි පවතිනයුරු දැක ගත හැකිය. උදාහරණ ලෙස දිවුලපිටිය, රුක්මල් ගම, ඇඹුල්දෙනිය, ජම්බුගස්මුල්ල, තලවතුගොඩ, කොස්වත්ත, ඇඹිල්ල වත්ත පාර, රබර් වත්ත පාර ආදි නම් දැක්විය හැකිය.

වර්තමානයේ කොළඹ නගරයේ විවිධ ස්ථාන එනම් නාගරික උද්‍යාන හා ඇවිදින මං තීරු හා මාර්ග දෙපස විවිධ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මකවන අතර එම අවස්ථාවලදි එම ප්‍රදේශවල ග්‍රාම නාම හා වීදි නාම සැලකිල්ලට ගෙන රෝපණය කරනු ලබන ශාක වර්ග තෝරා ගැනීමට ඇති හැකියාව සොයා බැලීම වටී. එමගින් එම ස්ථාන සඳහා අතීත ජෛව විවිධත්වය හා බැඳුනු වටිනාකමක් නිතැතින්ම ලැබෙනු ඇත.

**මූලාශ්‍ර**

1. Changing face of Colombo - R. L. Brother
2. කොළඹ පුරාණය - සමන් කළුආරච්චි
3. ගමට නම හැදුනු හැටි - මහින්ද කුමාර දළුපොත